පර්යේෂණ ක්ෂේත්‍රයේ 80 වසරක අභිමානය
80 வருட ஆய்வின் சாதனை
80 Years of Research Achievement

# තේ තතු

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි
ISSN - 1391- 6785
2005

## පහතරට තේ ඉඩම් වල ඵලදායිතාවය වැඩි කරලීම සඳහා අනුගමනය කල යුතු කප්පාදු පිලිවෙත්

තේ ඉඩමක් වැඩි ඵලදායිතාවයකින් දිගුකාලීනව පවත්වා ගෙන යාම සඳහා ඉඩමේ තිබිය යුතු නියමිත පඳුරු සංඛ්‍යාව නොවෙනස්ව පැවතීම සහ එම පඳුරු වල වැඩි දළු සංඛ්‍යාවක් නිපදවීමට සමත් නිරෝගී අතු වැඩි ප්‍රමාණයක් පැවතීම වැදගත්ය.

කප්පාදුව මගින් වැඩි ඵලදායිතාවයක් පවත්වා ගෙන යාම සඳහා තේ පඳුරු පාලනයත්, කප්පාදුව ආශ්‍රිතව කරනු ලබන පාංශු හා භූමිය සංවර්ධන ක්‍රියා පිලිවෙත් මගින් තේ වගාවේ දිගු කාලීන පැවැත්ම තහවුරු වේ.

එබැවින් මෙම ක්‍රියාවලිය නියමිත සැලැස්මක් මත තේ පඳුරු වලට අවශ්‍ය පූර්ව තත්ව ලබාදී කප්පාදුව පිළිබඳ පලපුරුදු ශ්‍රමිකයන් යොදවා, පඳුරුවල සනිපාරක්ෂාව තහවුරුවන අයුරින් නියමිත කාලයකදී කළ යුතුය.

### 1. නව කප්පාදු සැලැස්මක් සකස් කිරීම

යම් තේ වගාවක ඵලදායිතාවය වාර්ෂිකව නොවෙනස්ව තබා ගනිමින් කප්පාදු කිරීමට කප්පාදු සැලැස්මක් අවශ්‍යය. මේ සඳහා තේ වගාවේ විවිධ ක්ෂේත්‍ර කොටස් වල අස්වනු වාර්තා සටහන් කර ඒවායේ විභව අස්වනු රටා අධ්‍යයන කිරීමත් ප්‍රදේශයේ වර්ෂාපතන රටාව පිළිබඳව අවබෝධයක් තිබීමත් කප්පාදුව හා ඒ ආශ්‍රිතව කරනු ලබන ක්‍රියාවලීන් පිලිබඳ මනා අවබෝධයක් පැවතීමත් ඉතා වැදගත්ය.

### 2. කප්පාදුවට නියමිත ක්ෂේත්‍ර හඳුනා ගැනීම

මුහුදු මට්ටමේ සිට මීටර් 600 ට වඩා අඩු උච්චත්වයක් පවතින පහතරට කලාපයේ රිකිලි තේ වගාවක් වසර 3 කට වරක්ද මීටර් 600ට වැඩි උච්චත්වයක් පවතින දෙනියාය, රක්වාන ආශ්‍රිත රිකිලි තේ වගාවක් වසර 4 වරක්ද කප්පාදු කළ හැක. ඒ අනුව වසරකට කප්පාදු කරනු ලබන භූමි ප්‍රමාණය කප්පාදු කරන කාලාන්තරය අනුව වගාවේ භූමියෙන් 1/3 හෝ 1/4 හෝ ලෙස වෙන් කර ගත යුතුය. එසේම තේ වගාවේ විවිධ ක්ෂේත්‍ර වල අස්වනු හැකියාවන් සැලකිල්ලට ගනිමින් අ... වැඩි, මධ්‍යස්ථ හා අඩු ලෙස කාණ්ඩ 3 කට වර්ග කර එම කාණ්ඩද සමසමව නියෝජනය වන පරිදි වසරකදී කප්පාදු කරනු ලබන භූමි ප්‍රමාණය තීරණය කළ යුතුය. එමගින් වාර්ෂිකව ඵලදායිතාවය අඩු වැඩි වීම අවම කර ගත හැකිවේ. ඉතා කුඩා ඉඩම් කැබලි ඇති කුඩා තේ ගොවීන්ට මෙය අදාල නොවේ.

### 3. කප්පාදුවට පෙර දළු විරාමයකට පත් කිරීම

කප්පාදුවෙන් පසු නැවත වර්ධනය රඳා පවතින්නේ ඉතිරි කරන ලද ශේෂ අතු වලින් නිපදවන ආහාර සහ මුල්වල සංචිත ආහාර මතය. මුල් වල තැන්පත්ව ඇති කාබෝහයිඩ්‍රේට් 12% ට වඩා අඩු අගයක් ගනී නම් නැවත වර්ධනය ඉතා දුර්වල බව සොයා ගෙන ඇත. අධි අස්වනු කාලය අවසානයත් සමඟ කප්පාදු කිරීම මගින් තේ පඳුරුවල නව අතු වර්ධනය දුර්වල වන්නේද සංචිත අහාර මද බැවිනි. එනිසා තේ පඳුරු කප්පාදුවට පෙර සති 6-8 ක දළු විරාමයකට පත් කල යුතුය.

### 4. කප්පාදු ක්‍රමය සහ උස තීරණය කිරීම

පහතරට කලාපයට උචිතම කප්පාදු ක්‍රමය ලෙස වටශේෂ කප්පාදු ක්‍රමය දැක්විය හැක. මෙහිදී පත්‍ර 200-300 ඉතිර් වන පරිදි ශේෂ අතු 2-3 ක් ඉතිර් කර අඟල් 18"-22" උසකින් තේ පඳුරේ ඇති පැරණි අතු කපා ඉවත් කරනු ලබයි. ශේෂ අතු ඉතිර් කිරීම මගින් කප්පාදුවෙන් පසු නව රිකිලි වැඩෙන තුරු ආහාර නිපදවීම මගින් තේ පඳුරට පෝෂණය සැපයීමත් තේ පඳුරේ මුල් සහ අනෙකුත් කොටස් වල පර්වෘත්තිය ක්‍රියා නිසා ඇතිවන අහිතකර සංයෝග අලුතින් වර්ධනය වන අංකුර වල තැන්පත් වීම වලක්වා ශේෂ අතු වල පත්‍ර මත තැන්පත් කර ගැනීමක් සිදුවේ. රෝග සහ පලිබෝධ හානි නිසා දිරාපත් වූ අතු කප්පාදු උසට පහලින් පවතී නම් ඒවා පහළ මට්ටමෙන් කපා ඉවත් කල යුතුය. කප්පාදුවෙන් ඉවත් කරන කප්පාදු අතු කුඩා කැබැලි වලට කපා තේ පඳුර මත දින තුනක් පමණ වසා තැබීම මගින් රාමුව දැඩි සූර්යය රශ්මියට නිරාවරනය වීම නිසා පිලිස්සීමෙන් සිදුවන හානි අවම කර ගත හැක.

### 5.දිය ගැසූ හුණු ඉසීම

කප්පාදුවෙන් දින 3-4 කට පසු ජලයේ දියකරගත් දිය ගැසූ හුණු (අක්කරයකට හුණු කි.ග්‍රෑ.50: වතුර ගැලුම් 110) නැප්සැක් ඉස්නයක් භාවිතයෙන් තේ පඳුරේ රාමුවට ඉසිය යුතුය. මෙය තේ පඳුරේ රාමුවේ ඇති මීවන, පාසි සහ රෝග කාරක දිලීර ඉවත් කිරීමට උපකාර් වේ.

### 6.දිලීර නාශක ඉසීම

කප්පාදුවෙන් මාස 2 - 21/2 කට පසු අලුතෙන් ඇති වන අතු රිකිලි බුබුළු අංගමාරයෙන් ආරක්ෂා කර ගැනීම සඳහා තඹ (කොපර් 50%) අඩංගු දිලීර නාශකයක් ඉසිය හැක. (අවුන්ස 6 -7 ජලය ගැලුම් 15 ක දියකර අක්කරයක් සඳහා නැප්සැක් ඉසිනයකින් ඉසීම)

### 7.ශේෂ අතු ඉවත් කිරීම

කප්පාදුවෙන් මාස 1 1/2 -2 අතර කාලය තුලදී, තේ පඳුරු වල නව රිකිලි බොහොමයක පත්‍ර 4-5 ක් විවෘතව ඇති විට කප්පාදු උසට අඟල් 2ක් පමණ උඩින් ශේෂ අතු ඉවත් කල හැක.




### 8.මට්ටම කැපීම

අලුත් රිකිලි වැඩි ප්‍රමාණයක පත්‍ර 8-10 ක් ඇති විට (කප්පාදුවෙන් මාස 3 පමණ ගතවූ පසු) නව රිකිලි වල පත්‍ර 4-5ක් ඉතිර් කර භූමියේ බෑවුමට සමාන්තරව ඉහල අතු කපා ඉවත් කල යුතුය. එහෙත් මට්ටම කැපීමකින් තොරව දළු කැඩීම කලහොත් දළු තලයේ මට්ටම පවත්වා ගැනීමට නොහැකි වන අතරම නව රිකිලි වල වර්ධනයද දුර්වල වේ.




## කප්පාදුව ආශ්‍රිතව කරනු ලබන පාංශු හා භූමිය සංවර්ධන ක්‍රියාවලීන්

### 1.කප්පාදු අවධියේ ඩොලමයිට් යෙදීම $CaCO_3.MgCO_3$

තේ පඳුරු හොඳින් වර්ධනය සඳහා පසක තිබිය යුතු ප්‍රශස්ථ පී.එච්. පරාසය 4.5 - 5.5 කි. ඩොලමයිට් පාෂාණ කුඩු බවට පත් කර තේ වගාවට යොදන අතර එහිදී පහත සම්මතයන් සපුරා තිබිය යුතුය.(SLS) (i) ගනු ලබන ඩොලමයිට් වල MgO ප්‍රතිශතය අවම වශයෙන් 18% ක් තිබීම (ii) මී.මීටර් 0.5 දැලෙන් 90%ක් හැලී වෙන්වීමත් මිලි මීටර් 0.15 දැලෙන් 40-60% කොටසක් හැලී වෙන්වීමත්ය. මෙයින් අදහස් වන්නේ තේ වගාවට යොදන ඩොලමයිට් වල කුඩා අංශු සහ තරමක විශාල අංශු අඩංගු මිශ්‍රනයක් විය යුතු බවය. ඩොලමයිට් තේ වගා භූමියට යෙදිය යුත්තේ පසේ පී.එච්. අගය අනුව, කප්පාදුවට සති කිහිපයකට පෙර ඉඩමේ ඒකාකාරව විසුරුවා හැර්මෙනි.

### 2. පස සරු කිරීම සඳහා කාබනික ද්‍රව්‍ය එකතු කිරීම

පසේ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය වැඩි කර ගැනීම තුලින් පොහොර ජලය සහ වාතය හොඳින් රඳවා තබා ගැනීම වැඩි වන අතර හිතකර පාංශු ජීවීන්ගේ ක්‍රියාකාර්ත්වයද ඉහළ මට්ටමක පවත්වා ගැනීමට පුළුවන. මේ නිසා පොහොර වලින් උපර්ම ප්‍රයෝජන ලබාගත හැකිය. කාබනික ද්‍රව්‍ය වැඩි කිරීම තුලින් අස්වැන්න 25% කින් පමණ වැඩි වන බව පර්යේෂණ තුලින් සොයා ගෙන ඇත.



#### අ) කප්පාදු අතු වැලලීම

තේ පේළියක් හැර පේළියක අඟල් 6-7 ක් ගැඹුරට කානු කපා කුඩාවට කපන ලද තේ අතු කැබලි වැලලීම කල හැක. අක්කරයක් සඳහා දළ වශයෙන් ටොන් 5-7 පමණ කප්පාදු අතු ප්‍රමාණයක් අවශ්‍ය වේ.

තේ තතු

පර්යේෂණ ක්ෂේත්‍රයේ 80 වසරක අභිමානය
80 வருட ஆய்வின் சாதனை
80 Years of Research Achievement

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA
UNITAS SALUS NOSTRA
INCORPORATED 1925

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි ISSN - 1391- 6785

මෙම ක්‍රියාවලිය කප්පාදුවෙන් සතියකට පමණ පසු කල යුතුය. කප්පාදු චක්‍රය තුලදී මුළු අස්වැන්නේ වැඩි වීම අමු දලු කි. ග්‍රෑ. 1000-1200 පමණ වේ.

## ආ) කොම්පෝස්ට් හෝ සෙවන අතු යෙදීම

කප්පාදු කරන ලද ක්ෂේත්‍රයක මට්ටම කැපීමෙන් දින කිහිපයකට පසු තේ ඉඩමේ පස බුරුල් කිරීමත් සමඟ කොම්පෝස්ට් පොහොර හෝ සෙවන අතු යෙදීම සුදුසුය. මේ සඳහා දළ වශයෙන් කොම්පෝස්ට් පොහොර කිලෝ 5000-6000 අතර ප්‍රමාණයක් අක්කරයක් සඳහා අවශ්‍ය වේ.

## ඇ) තේ පේලි අතර මුල්ලු කිරීම

මුල්ලු කිරීම මඟින් පාංශු වාතනය සහ ජල වහනය දියුණු වන අතර එමඟින් මූල පද්ධතිය හොඳින් වැඩී පසේ පහල ස්ථරවල පැතිරීමට උපකාර වේ. තේ පඳුරු මට්ටම් කපන අවස්ථාවේදී තේ පේලියක් හැර පේලියක් පස පෙරලීමකින් තොරව පේලි අතර මුල්ලු කිරීම කල යුතුය. මෙමගින් කප්පාදු චක්‍රයක් තුලදී අස්වැන්න දළ වශයෙන් අමු දලු කිලෝ 1275 කින් වැඩිවීමක් සිදුවන බව සොයා ගෙන ඇත. කප්පාදු අතු වල දමා ඇත්නම් මෙය සිදු කිරීම අවශ්‍ය නොවේ.

## 3) ඵලදායී තේ පඳුරු සංඛ්‍යාවක් පවත්වා ගෙන යාමට පාලු සිටුවීම

කප්පාදුවට වසරකට පෙර කප්පාදුවට නියමිත ක්ෂේත්‍ර වල රෝග හා පළිබෝධ හානි වලට ලක්ව දුර්වලව පවතින තේ පඳුරු තෝරා ඉවත් කල යුතුය. එම පඳුරු ඉවත් කල පසු පාලුවන ස්ථානයේ පස ගැඹුරට මුල්ලු කර සියළුම ගල් හා වෙනත් පාංශු බාධක ඉවත් කර ඩොලමයිට් යොදා අවම වශයෙන් වසරක් පමණ පස පුනරුත්තාපනය වීම සඳහා මාන තෘණ සිටුවා නඩත්තු කල යුතුය.



පාලු සිටුවවීමට පෙර පුනරුත්තාපන තෘණ වැවීම

කප්පාදුවෙන් පසු මෙම පාලු ස්ථාන වල නිරෝගී පැල භාවිතා කර පාලු සිටුවීම මඟින් තේ ඉඩමේ ඵලදායී තේ පඳුරු වැඩි සංඛ්‍යාවක් පවත්වා ගෙන යාමට පුළුවන.

ලලිත් අමරතුංග